## 2016 අංක 05 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත

1983 මැයි මස 01 වන දින සිට 2009 මැයි මස 18 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ඉඩම් ඇතුළු සිය නිශ්චල දේපළ ආපසු ලබාගැනීම සඳහා නඩු කටයුතු පැවරීමට නොහැකි වූ තැනැත්තන් සඳහා විශේෂ නෛතික විධිවිධාන සැලසීම පිණිස 2016 අංක 05 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත 2016 අප්‍රේල් මස බලාත්මක කරන ලදී.

පනත අනුව, ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් සඳහා වලංගු නෛතික අයිතිවාසිකමක් ඇති යම් තැනැත්තෙකු (දේපළවල නීත්‍යානුකූල අයිතිකරු වශයෙන්) "අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු" වූයේ නම් (1983 මැයි මස 01 වන දිනයෙන් ආරම්භ වී 2009 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී යම් සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායමක ක්‍රියාකාරකම් හේතුවෙන් පැවති අවස්ථානුගත කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන්, ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් ආපසු ලබාගැනීම සඳහා අධිකරණයේ දී සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ තැනැත්තකු පනත අනුව "අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු" යන්නෙන් අර්ථ නිරූපණය කෙරේ.) කාලාවරෝධය හරහා හිමිකම්පාන වෙනත් යම් තැනැත්තකු විසින් එකී දේපළවල සන්තකය හෝ බුක්තිය දරමින් සිටිය ද, එසේ අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තාට ඔහුගේ/ඇයගේ දේපළවලට හිමිකම් ඉදිරිපත් කිරීම සිදුකළ හැකිය.

"අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකුට" පනතෙන් සලසන වාසිය, පනත ක්‍රියාත්මක කරන දින සිට වසර දෙකක කාලසීමාවක් ඇතුළත අත්කර ගැනීමට හිමිකම් තිබෙන බවට පනතේ 4 වන වගන්තියෙන් විධිවිධාන සලසයි. පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනය 2016 අප්‍රේල් මස 26 වන දිනය (කථානායකවරයාගේ සහතිකයේ සඳහන් දිනය වන,) වූ බැවින් පනත ක්‍රියාත්මක වීමට නියමිත කාලසීමාව 2018 අප්‍රේල් මස 26 වන දිනෙන් අවසන් වේ.

එබැවින් යම් තැනැත්තකු මෙම පනතේ විධිවිධාන යටතේ ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ දේපළ ආපසු ලබාගැනීම පිණිස හිමිකම් ඉදිරිපත් කිරීමට කැමැත්තක් දක්වන්නේ නම්, එවැනි හිමිකම් ඉල්ලීම 2018 අප්‍රේල් මස 26 වන දිනට පෙරාතුව ඉදිරිපත් කළ යුතුය.

භාෂා තුනෙන්ම සකසන ලද පනතේ ඉලෙක්ට්‍රොනික පිටපත් අධිකරණ අමාත්‍යාංශයේ http://moj.gov.lk යන නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. මෙම පනතේ අන්තර්ගත කරුණු පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයින් ද දැනුවත් කර ඇත. මෙම පනත ප්‍රකාර නීතිමය පියවර ගැනීමට කැමැත්තක් දක්වන තැනැත්තකු වෙතොත්, ඔහුට/ඇයට අදාළ නීතිමය උපදෙස් ලබාගත හැකිය.